# දරුවන් උදෙසා බයිබලයක්



# වැඳ නොවැටෙන මිනිසුන්

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

නෙබුකද්නෙශර් රජු විශාල
රන් පිළිමයක් ඉදි කළේය. එහි
හිස සිට පාදය දක්වා
රත්තරන් විය. තම රත්රන් බඳු
රාජ්‍යය සදාකාලික නොවන
බව හැඟවීමට දෙවියන්
වහන්සේ ඔහුට පෙන්වූ
සිහිනය රජුට අමතක වන්නට
ඇත. සම්පූර්ණයෙන්ම රනින්
කළ පිළිමයක් සෑදුවොත් ඔහු
දුටු සිහිනයෙන් දුන් දේව
වචනය සැබෑ නොවනු ඇතැයි
ඔහු සිතන්නට ඇත.



රජුගේ එක් සේවකයෙක් සියලු මිනිසුන්ට
රජු පැනවූ අණ කියවූයේය: "ඔබ බිම වැටී
රන් පිළිමයට නමස්කාර කළ යුතුය.
කිසියම් කෙනෙකු වැටී නමස්කාර
නොකරන්නේද ඔහු ඇවිළෙන ගිනි
උදුනක් මැදට හෙළනු ලැබේ."



මිනිසුන් තිදෙනෙකු හැර අන් සියල්ලෝම රජු අණ කළ පරිදි කළෝය. ඔවුහු හෙබ්‍රෙව් ජාතිකයන් වූවෝය. ඔවුන් දානියෙල්ගේ මිතුරන් වූ ශද්‍රක්, මේෂක් සහ අබේද්නෙගෝ ය. ඒ වන විට දානියෙල් එහි නොසිටි බව පෙනේ. මන්ද ඔහු සිටියානම් ඔහුද මිනිසුන් විසින් සාදන ලද පිළිමයකට නමස්කාර කිරීම ප්‍රතික්ෂේප කරණු ඇත.



රජුගේ ප්‍රඥාවන්තයෝ, දානියෙල්ට සහ ඔහුගේ මිතුරන්ට රජු කැමති නිසා ඔවුන්ට ඊර්ෂ්‍යයා කළෝය. එබැවින් ඔව්හු රජතුමාට කතා කොට, “ඔබ බබිලෝනිය පළාතේ පාලකයන් ලෙස පත් කළ මිනිසුන් තිදෙනෙක් සිටිති. ඔවුන් ශද්‍රක්, මේෂක් සහ අබෙද්නෙගෝය. රජතුමනි, මේ මිනිසුන් ඔබට කීකරු වන්නේ නැත, ඔවුන් ඔබේ දෙවිවරුන්ට සේවය කරන්නේවත් ඔබ පිහිටුවා ඇති රන් පිළිමයට නමස්කාර කරන්නේවත් නැතැ”යි කීවෝය.





නෙබුකද්නෙශර් රජු
කෝපයෙන් පිරී ගියේය.
ඔහු ඔවුන්ට අනතුරු
අඟවමින්, “ඔබ නමස්කාර
නොකරන්නේ නම්, ඔබ
ඇවිළෙන ගිනි උදුනක්
මැදට හෙළනු ඇත. එවිට,
මාගේ අතින් ඔබ
ගළවන්නේ කුමන
දෙවියන්ද?” කියා
ඇසුවේය.

රජතුමා කළේ විශාල වරදකි. ඔහු ඇත්තටම අභියෝග කළේ ජීවමාන දෙවියන් වහන්සේටය. පිළිමයකට නමස්කාර කිරීම දෙවියන් වහන්සේගේ නීතියට පටහැනි බව හෙබ්‍රෙව් ජාතිකයන් තිදෙනා දැන සිටියෝය. ඔවුන් නැවතී බලා සිටියෝය. ඔවුහු දෙවියන් වහන්සේව විශ්වාස කළ නිසා, රජුට බිය නොවූවෝය.



මේ නිර්භීත මිනිසුන් තිදෙනා රජුට පිළිතුරු දුන්නෝය. ඔව්හු කතා කොට, “අප සේවය කරන අපගේ දෙවියන් වහන්සේ ඇවිළෙන ගිනි උදුනෙන් අපව ගලවා ගැනීමට සමත් වන සේක; එසේ නොවුනත්, රජතුමනි, අපි ඔබේ දෙවිවරුන්ට සේවය නොකරන බවත් ඔබ පිහිටුවා ඇති රන් පිළිමයට නමස්කාර නොකරන බවත් ඔබට දන්වන්නෙමු”යි කීවෝය.



නෙබුකද්නෙශර් රජු අතිශය කෝපයට පත් වූයේය! උදුන සාමාන්‍යයෙන් රත් කරනවාට වඩා හත් ගුණයකින් රත් කළ යුතු බව ඔහු අණ කළේය. ඒ නමුත් ඔවුහු දණ නොගැසුවෝය.



ශද්‍රක් ද මේෂක් ද අබෙද්නෙගෝ ද
බැඳ දමා ඇවිළෙන ගිනි උදුනට
විසි කරන ලෙස
රජු තම සේනාවේ
බලවතුන්ට
අණ කළේය.



ගිනි උදුන කොතරම් උණුසුම්ව තිබුනේද යත්, ශද්‍රක්, මේෂක් සහ අබේද්නෙගෝව ගින්නට විසි කළ මිනිස්සු ගින්නේ රස්නෙන් මිය ගියෝය.



රජු ආරක්ෂිතව දුරින් සිට බලා සිටියේය. මිනිසුන් තිදෙනාවම ගිනි උදුන මැදට විසි කරනු ඔහු දුටුවේය. නමුත් ඔහු දුටුවේ එය පමණක් නොවේ.



නෙබුකද්නෙශර් රජු පුදුමයට පත් වූයේය! “අප මිනිසුන් තිදෙනෙකු බැඳ ගින්න මැදට විසි කළා නොවේද?” ඔහු තම සහායකයන්ගෙන් ඇසුවේය. “එසේය,” ඔව්හු පිළිතුරු දුන්නෝය. “බලන්න, මිනිසුන් හතර දෙනෙකු නිදැල්ලේ ගින්න මැද ඇවිදිමින් සිටිනු මම දකිමි. ඔවුන්ට හානියක් නැත. හතරවෙනි තැනැත්තා දෙවියන් වහන්සේගේ පුත්‍රයා වැනියැ”යි රජතුමා කීවේය.



ඇවිළෙන ගිනි උදුනේ දොර ළඟට ගිය
රජු, “මහෝත්තම දෙවියන් වහන්සේගේ
සේවකයන් වන ශද්‍රක්, මේෂක්,
අබෙද්නෙගෝ එළියට එන්න!”
කියා කෑ ගැසුවේය. එවිට ශද්‍රක්,
මේෂක් සහ අබෙද්නෙගෝ ගිනි
උදුනෙන් පිටතට පැමිණියෝය.



සියල්ලෝම රැස්ව හෙබ්‍රෙව්වන් තිදෙනා පරීක්ෂා කළෝය. ගින්නට ඔවුන්ව දවාලීමට බලයක් නොතිබූ බව ඔවුහු දුටුවෝය. ඔවුන්ගේ හිසකෙස්වත් ඔවුන්ගේ ඇඳුම්වත් පිළිස්සී නොතිබුණි. ඔවුන් තුළින් පිළිස්සුම් ගඳක් වත් නික්මුනේ නැත.



සිදුවූයේ කුමක්දැයි දැනගත් නෙබුකද්නෙශර් රජු ඉතා නුවණැති දෙයක් කළේය. ඔහු යාච්ඤා කරමින්, “තම දූතයා එවා, තමන් කෙරෙහි විශ්වාසය තැබූ තම සේවකයන්ව ගලවාගත් ශද්‍රක්, මේෂක් සහ අබෙද්නෙගෝ ගේ දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා”යි කීවේය.



වැඳ නොවැටෙන මිනිසුන්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

දානියෙල් 3

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)